(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(16).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 දෙසැම්බර් 13 බදාදා**

---

**2024 ජනවාරි 09 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1464/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ධීවර සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම සමිතිවල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ධීවර සමුපකාර සමිති වැඩිම සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය කවරේද;

(iv) ධීවර සමුපකාර සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1512/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඇති වාහන සංඛ්‍යාව;

(ii) එම වාහන අතරින් සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ඇති වාහන සංඛ්‍යාව;

(iii) කුලී පදනම මත රජයේ ආයතනවලට ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව;

(iv) කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සඳහා ගෙවනු ලබන වාර්ෂික කුලී මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1550/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කුරුඳු වගාකරුවන් අතර බෙදා දී ඇති කුරුඳු පැල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් කුරුඳු වගාකරුවෙක් වෙත ලබා දී ඇති කුරුඳු පැල සංඛ්‍යාව කොපමණද;

(iii) එම කුරුඳු පැල බෙදා දී ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුඳු පැලවලට අමතරව කුරුඳු වගාකරුවන්ට ලබා දෙනු ලබන වෙනත් පහසුකම් කවරේද;

(ii) වර්ෂ 2019 සිට මේ දක්වා කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1586/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ නිරන්තරයෙන් ගංවතුර තත්ත්වයන් ඇති වන බවත්;

(ii) වර්ෂයකට දෙතුන් වතාවක් ගංවතුරෙන් යටවන ප්‍රදේශ එම දිස්ත්‍රික්කයේ පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුර ඇති වීම පාලනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට සකස් කර ඇති සැලසුම් කවරේද;

(iii) එම සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1625/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා කාලය තුළදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1556ක් අතරින් 2020 දෙසැම්බර් මස 31 දින වනවිට විසඳුම් ලබා දී තිබූ පැමිණිලි සංඛ්‍යාව; විමර්ශන කටයුතු අවසන් නොකරන ලද පැමිණිලි සංඛ්‍යාව; ඉවත්කර ගන්නා ලද පැමිණිලි සංඛ්‍යාව සහ කැඳවීම් කිරීමට නියමිතව ඇති පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින් විමර්ශනය කර ඒ සඳහා විසඳුම් ලබා දීමට නොහැකි වීමට හේතු කවරේද;

(iii) අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කර විසඳුම් ලබා දීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම වැළැක්වීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන මෝටර් රථ පරීක්ෂකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා ඔවුන් විසින් අනතුරුවලට ලක් වූ වාහන පරීක්ෂාකර ලබා දී ඇති වාර්තා සංඛ්‍යාව කොපමණද;

(iii) බහුල වශයෙන් අනතුරු සිදු වීමට මූලික හේතූන් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ එම පරීක්ෂණ වාර්තාවල ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිර්දේශ, ප්‍රතිපත්තියක් ලෙස සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1688/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව-සෙට්ටිකුලම් මූලික රෝහලෙන් පවුල් 8,614කට අයත් පුද්ගලයින් 28,201ක් පමණ වෛද්‍ය සේවාවන් ලබා ගනු ලබන බවත්;

(ii) එම රෝහලේ මූලික පහසුකම් නොමැති වීමෙන් සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට එම ජනතාවට කි.මී. 40ක් පමණ දුරින් පිහිටි වවුනියාව රෝහලට යාමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සෙට්ටිකුලම් මූලික රෝහලේ අංක 1,2,3,4,5 හා 6 යන වාට්ටු ගොඩනැගිලි, රසායනාගාර සහ සායනික කටයුතු පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල පැරණි බවත්;

(ii) සෙට්ටිකුලම් රෝහලේ මෘත ශරීරාගාරයක් පැවතියද, එහි අධිකරණ වෛද්‍යවරයෙකු සහ හදිසි මරණ පරීක්ෂකවරයෙකු නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා මෘතදේහ වවුනියාව රෝහල වෙත රැගෙන යාමට සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත ආ (i)හි සඳහන් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමට මුදල් වෙන් කරන්නේද;

(ii) එම රෝහලට අධිකරණ වෛද්‍යවරයෙකු සහ හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1766/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ බීජ ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිතකර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඒවායේ නිෂ්පාදනය කරනු ලබන බීජ වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙරටට බීජ වර්ග ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, ආනයනය කරනු ලබන බීජ වර්ග කවරේද;

(iii) වර්ෂ 2018 සිට 2022 දක්වා බීජ වර්ග ආනයනය කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2397/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ පේෂකර්ම මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේෂකර්මාන්ත නිෂ්පාදන පසුබෑමකට ලක් වී ඇති බව පිළිගන්නේද;

(iv) පේෂකර්මාන්ත නිෂ්පාදන නගාසිටුවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2552/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2022.12.31 වැනි දිනට විශ්‍රාම ගන්වන ලද රජයේ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විශාල ගුරුවරුන් සංඛ්‍යාවක් එකවර විශ්‍රාම ගැන්වීම හේතුවෙන් රජයේ පාසල් පද්ධතිය අකර්මණ්‍ය වීමේ අවදානමක් තිබේද;

(iii) ඉහත විශ්‍රාම ගැන්වීම හේතුවෙන් ඇති වූ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජුනි 01 දිනැති අංක 2334/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ධීවර අමාත්‍යතුමා,— සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව (2018),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 වගන්තිය යටතේ 2023.01.17 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත සීනෝර් පදනමේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ධීවර අමාත්‍යතුමා,— ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2022.11.30 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

ධීවර අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2020),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ 2023.03.24 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.07.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

සවීර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 ජනවාරි 09 අඟහරුවාදා)**

1519/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා විදේශ ගත වී ඇති මධ්‍යම පරිසර අධිකාරියේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් අතරින් උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගත වූ සේවකයන් සංඛ්‍යාව සහ සමුළු/පුහුණු වැඩමුළු සඳහා විදේශ ගත වූ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා උසස් අධ්‍යාපන කටයුතු/සමුළු/පුහුණු වැඩමුළු සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාලය තුළදී උසස් අධ්‍යාපන කටයුතු/සමුළු/පුහුණු වැඩමුළු සඳහා අධිකාරියට ලැබුණු විදේශීය අරමුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3177/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රසායනික පොහොර තහනම් කර කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයට පෙර, වර්ෂ පහක ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් අස්වැන්න සහ එම වර්ෂ පහ තුළදී රජය විසින් පොල් වැවිලිකරුවන් වෙත ලබා දෙන ලද පොහොර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල වකවානුවේදී පොල් වැවිලිකරුවන් වෙත ලබා දෙන ලද සහනාධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාබනික පොහොර හඳුන්වා දෙන ලද වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික පොල් අස්වැන්න සහ එම කාලය තුළදී රජය විසින් පොල් වැවිලිකරුවන් වෙත ලබා දෙන ලද පොහොර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල වකවානුවේදී පොල් වැවිලිකරුවන් වෙත ලබා දෙන ලද සහනාධාර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රසායනික පොහොර තහනම් කිරීමට පෙර සහ පසු පොල් නිෂ්පාදනයේ වැඩිවීම/අඩුවීම ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3675/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ලබා ගන්නා ජනාධිපතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ලබා දී ඇති, රජයේ දීමනා ලබන කාර්යය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කාර්ය මණ්ඩලයේ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ජනාධිපතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින් යොදවා තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ජනාධිපතිවරයාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ආරක්ෂාව සඳහා යොදවා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3704/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 සිට මේ දක්වා පත් කර ඇති ජනාධිපති විමර්ශන කොමිෂන් සභා සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ එක් එක් විධායක ජනාධිපතිවරයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කොමිෂන් සභා සංඛ්‍යාව, ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය, අධ්‍යාපනය, මැතිවරණ ප්‍රතිසංස්කරණ සහ දූෂණ අනාවරණය කිරීම යන එක් එක් විෂය ක්ෂේත්‍රය අනුව සහ එක් එක් විධායක ජනාධිපතිවරයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් කොමිෂන් සභාවල වාර්තා අනුව අනාවරණය වූ වැරදිකරුවන් හා ඔවුන්ට ලබා දීමට නිර්දේශ කර ඇති දඬුවම් එක් එක් කොමිෂන් සභාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් කොමිෂන් සභාව සඳහා වැයකර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කොමිෂන් සභාවල අවසන් වාර්තා මහජනතාවට පරිහරණය කිරීම සඳහා තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) මේ දක්වා අවසන් වාර්තාවක් නිකුත් කර නොමැති කොමිෂන් සභා කවරේද;

(v) එම එක් එක් කොමිෂන් සභාව පත් කරන ලද කාල වකවානුව සහ සාමාජිකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3712/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 ජනවාරි 01 දින සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා විදේශීය නිල සංචාර සඳහා ශ්‍රී ලංකාවේ එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, මණ්ඩලය, රාජ්‍ය සංස්ථාව, ව්‍යවස්ථාපිත මණ්ඩලය නියෝජනය කරමින් සහභාගි වූ නිලධාරින්ගේ නම් සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සහභාගි වූ අමාත්‍යවරුන්ගේ, රාජ්‍ය අමාත්‍යවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ හා නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම විදේශීය නිල සංචාර සඳහා ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් එක් එක් විදේශීය නිල සංචාරයෙන් ලබා ගත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකාව ආර්ථික ව්‍යවසනයකට ලක් වී ඇති අවස්ථාවක ඉහත සඳහන් පරිදි විශාල මුදලක් වැය කර විදේශීය නිල සංචාර සඳහා අවස්ථාව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3729/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට ,— (1)

(අ) (i) කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිව් බසාර් ග්‍රාම නිලධාරි වසමේ, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් පාර, අංක 180/70 ජේ දරන ස්ථානයේ පදිංචි වී සිටින ෆාතිමා සහ්රා මහත්මිය වයස අවුරුදු 5ක ආබාධිත කුඩා දරුවෙකුද සිටින අඩු ආදායම්ලාභියකු වන නමුත් ඇයට අස්වැසුම මාසික මූල්‍යාධාරය මේ දක්වා ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ලි.ප. අංක NH-1-1-03-01-070-00719 දරන ඉල්ලුම්පත්‍රයට අදාළ අස්වැසුම මූල්‍යාධාරය සහ්රා මහත්මියට කඩිනමින් ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3741/2023

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ “ට” උපලේඛනයට අනුව අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල ලේකම්වරුන්ට සහ අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුවන්ට විශ්‍රාම වැටුප් හිමි බව දන්නේද;

(ii) මේ වනවිට එම විශ්‍රාම වැටුප් ලබාගන්නා සහ ඒ සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් ලේකම්වරුන්ට වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සහ විශ්‍රාම පාරිතෝෂික හිමිකම ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ ලේඛන යොමු කිරීම සම්න්ධයෙන් රජයේ ආයතනවල විෂය ලිපිකරුවන්ට පුහුණුවක් ලබා දෙන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සෘජු දුරකථන අංකයක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයක ලේකම්වරයෙකු සහ වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙස කටයුතු කළ වමල් එස්. පියසුන්දර මහතාගේ විශ්‍රාම වැටුප මේ දක්වා ගෙවා නොමැති බව දන්නේද;

(ii) එයට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජනවාරි 10 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1818/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්මාන අතරින් පානීය ජල පහසුකම් නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල ජනතාවට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2535/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා පොලිස් ස්ථානය ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(ii) ඉහත පොලිස් ස්ථානය ස්ථාපනය කර ඇති ඉඩම හිමි පාර්ශ්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කින්නියා පොලිස් ස්ථානය දීර්ඝ කාලයක සිට පුද්ගලික පාර්ශ්වයක් සතු ඉඩමක පවත්වාගෙන යාම හේතුවෙන් එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නොහැකි වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත පොලිස් ස්ථානය සඳහා රජයේ ඉඩමක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2582/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'අපේ ගම' ආයතනයේ කාර්යභාරය මේ වනවිට නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද;

(ii) එම ආයතනයේ සේවා පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එම ආයතනයේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදු කරන්නේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය විසින් උපයන ලද ආදායම කොපමණද;

(v) එම ආයතනයේ ඉදිරියේදී සිදු කිරීමට නියමිත සංවර්ධන කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2624/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3239/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් මහජනතාව වෙත බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, වර්ෂ 2021 සිට මේ දක්වා පදිංචිකරුවන් සහ වගාකරුවන් වෙත ඔප්පු ලබා දී ඇති ඉඩම් අක්කර ප්‍රමාණය හා ඔප්පු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මේ වනවිට ඔප්පු ලබා දී නොමැති ඉඩම් සඳහා ඉදිරියේදී ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජනවාරි 11 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2851/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අස්වැන්න බහුල කාලවලදී එම අස්වැන්න මිලදී ගෙන ගබඩා කර තැබීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එම මිලදී ගනු ලබන මත්ස්‍ය අස්වැන්න ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් තිබේද;

(iii) මත්ස්‍ය අස්වැන්න අඩු වාරකන් කාලවලදී, පාරිභෝගිකයන්ට සහන මිලට මාළු ලබා දීමට ක්‍රමවේදයක් තිබේද;

(iv) ධීවරයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශ්වයම ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2976/2023

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමහර රජයේ රෝහල්වල ඇතැම් ඖෂධ වර්ග නොමැති අවස්ථා සහ ප්‍රමාණවත් ඖෂධ තොග නොමැති අවස්ථා වර්තා වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් රෝගීන් දැඩි අපහසුතාවයන්ට පත් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයේ රෝහල්වලට ඖෂධ මිලදී ගැනීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් වගකිවයුතු ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විවිධ අවස්ථාවලදී, රජයේ රෝහල්වල ඇතැම් ඖෂධ වර්ග හිඟවීම සඳහා බලපා ඇති හේතු කවරේද;

(iii) එවැනි සිදුවීම් නැවත ඇති නොවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3081/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දෛනික ආදායම කොපමණද;

(ii) මණ්ඩලයේ බස්රථ ඇණිය දෛනිකව ධාවනය කරනු ලබන දුර ප්‍රමාණය කිලෝමීටර් කොපමණද;

(iii) ඒ සඳහා වන දෛනික ඉන්ධන අවශ්‍යතාවය කොපමණද;

(iv) එම ඉන්ධන සඳහා වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3157/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන යටතේ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් මේ වනවිට බඳවාගෙන ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාලාභීන් අනුයුක්ත කර ඇති ආයතන සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රැකියාලාභීන් අතරින් මේ වනවිට සේවයේ ස්ථිර කර ඇති රැකියාලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට සේවයේ ස්ථිර කර නොමැති රැකියාලාභීන්, ස්ථිර කිරීම සඳහා පවතින වැඩපිළිවෙළ කවරේද;

(v) ඉහත රැකියාලාභීන් සඳහා උසස්වීම් ක්‍රමවේදයක් සහ සුභසාධන වැඩසටහනක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3579/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට තෙල් නලයක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ගැනීම සඳහා බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) එම තෙල් නලය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iv) එම තෙල් නලය ස්ථාපිත කිරීමෙන් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ඇති වන බලපෑම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3111/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වේලනයිතුරෙයි සිට පුංගුඩුතිව්, මඩත්තුවෙළි දක්වා වන පාලම ශ්‍රී ලංකාවේ දිගම පාලම්වලින් එකක් බවත්;

(ii) එම පාලම මතින් ගමන් කිරීම මේ වනවිට දැඩි අවදානම් සහගත බවත්;

(iii) පාලම මතදී බොහෝ අනතුරු සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාලමේ දිග කොපමණද;

(ii) පාලම මත අනතුරු සිදු වීම සඳහා බලපාන හේතු කවරේද;

(iii) එම පාලම අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද වර්ෂය කවරේද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

(vi) එම පාලම සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3178/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති පොල් මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව පොල් මිලේ ඉහළ යාමක් සිදු වී තිබේද;

(iii) පොල් මිල ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආනයනික රටවල සහ ආනයනකරුවන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවට පොල් ආනයනය කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3236/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, ධර්මදූත විද්‍යාලයේ පැවති රථ පෙළපාළියක් අතරතුර කැබ් රථයක් පෙරළී යාමෙන් මෑතකදී සිදු වූ අනතුර හේතුවෙන් මියගිය සහ තුවාල ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත අනතුර සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම විමර්ශනයේ නිගමන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාසල් මඟින් රථ පෙළපාළි පැවැත්වීමේදී, පිළිපැදිය යුතු නිර්ණායක ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3410/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය කර මීට වර්ෂ 25කට පමණ පෙර විශ්‍රාම ගන්වන ලද සේවකයන් 18 දෙනෙකුට විශ්‍රාම වැටුප් ගෙවන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව විසින් කරන ලද නිර්දේශ මේ වනතෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්;

(ii) මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2005 මඟින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම් දී ඇති බවත්;

(iii) එම සේවකයන් 18 දෙනා විශ්‍රාම වැටුප් ලැබීමට සියලු සුදුසුකම් සපුරා ඇති බව ගුවන් විදුලි සංස්ථාවේ එවකට සභාපතිවරයා විසින් එවකට අමාත්‍යවරයාට හා ලේකම්වරයාට දන්වා ඇති බවත්;

(iv) ජනමාධ්‍ය අමාත්‍යාංශයේ එවකට අතිරේක ලේකම් විසින් ඉහත සේවකයන්ටද විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බවට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත සේවකයන් 18 දෙනාට විශ්‍රාම වැටුප් ගෙවනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3589/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් පසු තහනම් කරන ලද සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම සංවිධාන තහනම් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iv) එම සංවිධාන අතරින් මේ වනවිට තහනම ඉවත් කරන ලද සංවිධාන කවරේද;

(v) තහනම ඉවත් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(vi) පාස්කු ප්‍රහාරයට සෘජුව හා වක්‍රව සම්බන්ධ සංවිධාන හා පුද්ගලයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජනවාරි 12 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3360/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අතුරල - උතුර ග්‍රාම නිලධාරි වසමේ ස්ථාපිත කර තිබූ අතුරල කනිෂ්ඨ විද්‍යාලය එම ස්ථානයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතුව කවරේද;

(ii) එම විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩමේ මුල් අයිතිකරුගේ නම, පිඹුරුපත් අංකය හා විශාලත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා භාවිතා කර තිබූ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) විද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා එම ඉඩම අත්පත් කර ගන්නා ලද වර්ෂය කවරේද;

(v) මේ වනවිට ඉහත ඉඩම අයත් ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3366/2023

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාස්කු ඉරිදා දින සිදු කරන ලද ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් වෙනුවෙන් ඔවුන්ගේ පවුල්වලට වන්දි ලබා දී තිබේද;

(ii) එම ප්‍රහාරය හේතුවෙන් දෙමව්පියන් අහිමි වූ දරුවන් රැකබලා ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම දරුවන් රැකබලා ගැනීම සඳහා ඔවුන්ගේ ඥාතීන් වෙත මාසික දීමනාවක් ගෙවනු ලබන්නේද;

(iv) එම ප්‍රහාරය හේතුවෙන් ආපදාවට ලක් වී සිටින පුද්ගලයන් සඳහා රජයේ අනුග්‍රහයෙන් විදේශ ප්‍රතිකාර ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3425/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම අපේක්ෂා රෝහලේ සායන සඳහා දෛනිකව පැමිණෙන රෝගීන් සඳහා නියම කරනු ලබන පිළිකා නාශක ඖෂධ එම රෝහලේ නොමැතිවීම හේතුවෙන් ඒවා රෝගීන්ට නිකුත් නොකරන බවත්;

(ii) ඉතා මිල අධික එම ඖෂධ මිලට ගැනීමට ආර්ථික ශක්තියක් නොමැති එම රෝගීන්, පිළිකා රෝගය උත්සන්න වීමෙන් ජීවිතක්ෂයට පත්වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහරගම අපේක්ෂා රෝහලේ සායන සඳහා දෛනිකව පැමිණෙන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහලේ මේ වනවිට හිඟ ඖෂධ වර්ග කවරේද;

(iii) ඖෂධ හිඟය මඟහරවා ගෙන, අත්‍යාවශ්‍ය පිළිකා නාශක ඖෂධ, එම රෝහලට ලබා දීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3483/2023

ගරු වේලු කුමාර් මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු ඉඩම්, කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ලබා දීමට 2021.09.06 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා ''ගලබොඩ'' සහ ''මවුන්ට් ජීන්'' යන එක් එක් වත්තෙන් ලබා ගනු ලබන ඉඩම් අක්කර ප්‍රමාණය;

(ii) එම ඉඩම් ලබා ගනු ලබන එක් එක් සමාගම, එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ජාතිකත්වය (ස්වදේශිකද / විදේශිකද);

(iii) ඉහත එක් එක් සමාගම විසින් ගෙවනු ලබන අත්තිකාරම් මුදල සහ ඉඩම් අක්කරයක වාර්ෂික බදු මුදල;

(iv) ඉහත වතුවල කිරි ගොවිපොළ සඳහා වෙන් කරනු ලබන භූමියේ ඇති පේළි නිවාස හා සිද්ධස්ථාන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත වතු පිහිටා ඇති දිස්ත්‍රික්කවල ඇති රජයේ කිරි ගොවිපොළ සතුව ප්‍රමාණවත් ඉඩම් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, තේ වගා කළ හැකි ඉඩම්, කිරි ගොවිපොළ සඳහා ලබාදීමේ පදනම කවරේද;

(iii) මෙම කිරි ගොවිපොළ පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3753/2023

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව යන එක් එක් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, දින 60කට වඩා වැඩි, දින 90කට වඩා වැඩි, දින 120කට වඩා වැඩි, දින 180කට වඩා වැඩි සහ දින 360කට වඩා වැඩි යන කාල වර්ගීකරණය අනුව;

(ii) ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදකයන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, දින 60කට වඩා වැඩි, දින 90කට වඩා වැඩි, දින 120කට වඩා වැඩි සහ දින 180කට වඩා වැඩි යන කාල වර්ගීකරණය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්දියානු ණය ආධාර ඇණවුම් මත ඖෂධ සැපයූ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල;

(ii) 2023.01.01 දින සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය, වෛද්‍ය සැපයීම් අංශය සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඖෂධ සැපයුම්කරුවන් සහ ඖෂධ නිෂ්පාදකයන් සඳහා ගෙවා ඇති මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3515/2023

ගරු අසංක නවරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් රෝහලේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ වෛද්‍ය, හෙද හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ තනතුරුවල මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2023 දක්වා ඉහත සඳහන් එක් එක් රෝහලේ විදේශීය හා දේශීය නිවාඩු ලබා ගෙන ඇති වෛද්‍යවරුන්, හෙදියන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාලය තුළ විශ්‍රාම ගත්වා ඇති වෛද්‍යවරුන්, හෙදියන් සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3570/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු රජයේ සේවකයන්ට මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ගතවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් සමහර රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන අවස්ථා ඇති බවත්;

(iii) එම ප්‍රමාදය ඔවුන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3645/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, බදුල්ල ඩිපෝව මඟින් බදුල්ල නගරයේ සිට දෙමෝදර හරහා වේවැල්හින්න දක්වා; මඩොල්සිම-කුරුවිගොල්ල හරහා කොකාගල දක්වා; ලුණුගල හරහා පල්ලේකිරුව දක්වා; දෙමෝදර හරහා ඕතුඹ දක්වා; රොකතැන්න දක්වා සහ රොසට් දක්වා ධාවනය කරන ලද බස් රථ ඇතුළු වෙනත් අතුරු මාර්ග රැසක බස් රථ ධාවනය කිරීම මේ වනවිට සිදු නොකරන බවත්;

(ii) මේ හේතුවෙන් වතු ආශ්‍රිත ප්‍රදේශවල පාසල් ළමුන් සහ විවිධ අවශ්‍යතා සඳහා බදුල්ල නගරයට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බස් රථ සේවාවන් නැවත ධාවනය කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම සේවාවන් නැවත ආරම්භ කරනු ලබන දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3758/2023

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට 2022 දක්වා විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැය කරන ලද මුදල;

(ii) වර්ෂ 2010 සිට 2022 දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලද තීරු බදු සහන වාහන බලපත්‍රවලට අදාළ තීරු බදු සහනයේ මූල්‍ය වටිනාකම;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3775/2023

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2022 දෙසැම්බර් 31 දිනට—

(i) සිය අරමුදල් ආයෝජනය කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදල උපයා ඇති මුළු මුදල;

(ii) අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකම;

(iii) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, අරමුදලේ මුළු තැන්පතුවල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට—

(i) සේවක අර්ථසාධක අරමුදලේ දායකයන් සංඛ්‍යාව;

(ii) සක්‍රිය දායකයන් සංඛ්‍යාව;

(iii) ඉහත සක්‍රිය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකම;

(iv) අරමුදල් ආයෝජනය කිරීමෙන් උපයන ලද මුළු මුදල, සක්‍රිය දායකයන්ගේ ගිණුම් ශේෂයන්හි මුළු වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?